**විශේෂ සටහන 1**

## සැපයුම් අංශයේ උද්ධමනය හේතුවෙන් මුදල් ප්‍රතිපත්තියට වන බලපෑම

සැපයුම් අංශයේ උද්ධමනය නිෂ්පාදන පිරිවැයේ වෙනස්වීම් හේතුවෙන් සිදුවන අතර එය බොහෝ විට පිරිවැයෙන් තල්ලුවන උද්ධමනය ලෙස ද හැඳින්වේ. මෙලෙස සැපයුම් අංශයේ උද්ධමනය ඇතිවීම කෙරෙහි යෙදවුම් ලබා ගැනීමට ඇති බාධා, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් වෙනස්වීම්, බදු සංශෝධන සහ රජයේ නියාමන ක්‍රියාමාර්ගවල ඇතිවන වෙනස්වීම්, අහිතකර කාලගුණික තත්ත්ව, ගෝලීය ආර්ථික තත්ත්ව සහ භූ දේශපාලනික අර්බුද හේතුවෙන් ඇතිවන සැපයුම් දාම අවහිරතා, සහ නිෂ්පාදන ක්‍රියාවලීන්ගේ අකාර්යක්ෂමතා වැනි සාධක බලපායි. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සැලකීමේ දී, ආහාර උද්ධමනයේ නිරන්තර උච්චාවචන ඇති කරන අවිධිමත් කාලගුණික රටා සැපයුම් අංශය හරහා උද්ධමනය කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයක් වේ. අනෙකුත් බොහෝ රටවලට මෙන්ම ශ්‍රී ලංකාවට ද, දේශගුණික විපර්යාස ආර්ථික ක්‍රියාකාරකම් සහ සමාජ යහපැවැත්ම කෙරෙහි බලපෑම් ඇති කරයි. මීට අමතරව, ගෝලීය සැපයුම් දාම වෙනස්වීම් මෙන්ම සැපයුම් අවහිරතා මධ්‍යයේ නිෂ්පාදන පිරිවැය වැඩිවීම, සැපයුම් අංශය හරහා ඇතිවූ උද්ධමනයේ මෑත කාලීන උච්චාවචනවලට ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම සැපයුම් අංශයේ පීඩන කෙටි කාලීන වේ නම්, මුදල් ප්‍රතිපත්තිය කෙරෙහි ඒවා සැලකිය යුතු බලපෑමක් ඇති නොකරනු ඇත. කෙසේ වෙතත්, සැපයුම් සාධක හේතුවෙන් උද්ධමනය අඛණ්ඩව ඉහළ යෑමත් සමඟ ප්‍රධාන වශයෙන් අහිතකර උද්ධමන අපේක්ෂා වර්ධනය වීම හේතුවෙන් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සංකීර්ණ කළ හැකි අතර එය මහ බැංකුවක විශ්වසනීයත්වය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කළ හැකිය. පර්යේෂණ වාර්තා පෙන්වා දෙන පරිදි, සැපයුම් අංශයට වන බාධා කෙටිකාලීන වන විට කිසිදු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයකින් තොරව උද්ධමනය යළි සමතුලිතතාවයට පැමිණෙන අතර, නිරන්තරයෙන් සිදුවන සැපයුම් කම්පන පූර්වෝපායික මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල අවශ්‍යතාව ඇති කරමින් වක්‍ර බලපෑම් ඇති කරයි (John, Kumar and Patra, 2022).

### ශ්‍රී ලංකාවේ උද්ධමනය කෙරෙහි කාලගුණික රටා සහ දේශගුණික විපර්යාසවල බලපෑම

බොහෝ දුරට මානව ක්‍රියාකාරකම් හේතුවෙන් පෘථිවියේ උෂ්ණත්වයේ සහ එහි දේශගුණ පද්ධතියේ විවිධ පැතිකඩයන්හි සිදුවන කල්පවත්නා වෙනස්වීම් දේශගුණික විපර්යාසවලට ඇතුළත් වේ. එහි බලපෑම් පුළුල් සහ විවිධ වන අතර, පාරිසරික, සමාජයීය, ආර්ථිකමය සහ සෞඛ්‍යමය බලපෑම් එයට ඇතුළත් වේ. අක්‍රමවත් කාලගුණික රටා සහ දේශගුණික විපර්යාස නිසා ආහාර උද්ධමනයේ සැලකිය යුතු උච්චාවචන ඇති විය හැකිය. විශේෂයෙන් ම, ආහාර ද්‍රව්‍ය පරිභෝජන පැසෙහි විශාල කොටසකට හිමිකම් කියන ශ්‍රී ලංකාව වැනි රටක, මතුපිට උද්ධමනයේ ඉහළ උච්චාවචනයක් ඇති කිරීමට එය හේතු විය හැකිය.[1] ප්‍රධාන වශයෙන් වර්ෂාපතන රටාවේ වෙනස්වීම් සහ උෂ්ණත්වය ඉහළ යෑම මගින් කෘෂිකාර්මික අංශයට බලපෑම් ඇති විය හැකිය. සහල් සහ පොල්[2] ඇතුළු ශ්‍රී ලංකාවේ ප්‍රධාන භෝගවලට සැලකිය යුතු බලපෑමක් උෂ්ණත්වයේ සහ වර්ෂාපතනයේ වෙනස්කම් නිසා එල්ල වේ. විශේෂයෙන් ම ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම හේතුවෙන් රාත්‍රී කාලයේ උෂ්ණත්වය වැඩිවීම සහල් අස්වැන්න සැලකිය යුතු ලෙස අඩු වීමට හේතු වේ. නිදසුනක් වශයෙන්, පිලිපීනයේ ජාත්‍යන්තර සහල් පර්යේෂණ ආයතනයේ දී සිදු කරන ලද ක්ෂේත්‍ර පර්යේෂණ මගින්, වියළි කාලවලදී අවම උෂ්ණත්වයේ සෑම සෙල්සියස් අංශක 1ක වැඩිවීමක් සඳහාම සහල් අස්වැන්න සියයට 10කින් අඩු වන බව සොයාගෙන ඇත (Peng et al., 2004). සාමාන්‍ය කාලගුණික තත්ත්ව ඇති කාලවල දී එළවළු සහ පලතුරු මිල ගණන්හි හැසිරීම යම්තාක් පුරෝකථනය කළ හැකි වුවද, දේශගුණික විපර්යාස හෝ අසාමාන්‍ය කාලගුණික රටාවන්වලදී සහල්, එළවළු සහ පලතුරු මත බලපෑම් ඇතිවන බැවින් ඒවායේ මිල ගණන් පුරෝකථනය කළ නොහැකිය. ඉහත කරුණු වලට අමතරව, දීර්ඝ නියං කාලවල දී අඩු වියදම් ජල විදුලිය වෙනුවට මිල අධික ඉන්ධන මත පදනම්ව විදුලිය උත්පාදනය කිරීමට සිදුවන නිසා එය විදුලි මිලට බලපෑ හැකි අතර, එමගින් කාලගුණය සහ දේශගුණය සම්බන්ධ බාධාවන් පුළුල් ආර්ථිකයට සම්ප්‍රේෂණය කරමින් විශාල සැපයුම් අවහිරතා ඇති කරයි.

ඉහත කරුණුවලට අනුව, අහිතකර කාලගුණික සිදුවීම් සැලකිය යුතු සාර්ව ආර්ථික බලපෑම් ඇති කළ හැකිය. අතීතයේ දී මෙම බලපෑම් බොහෝ දුරට තාවකාලික ලෙස සැලකූ අතර, මහ බැංකු ඒ කෙරෙහි එතරම් සැලකිල්ලක් නොදැක්වීය. කෙසේ වෙතත්, තාපතරංග, දිගු නියඟ හෝ ගංවතුර වැනි කාලගුණික වෙනස්වීම්වල වාර ගණන සහ තීව්‍රතාවය වැඩි වීමේ ඍජු හා වක්‍ර බලපෑම්වල ඒකාබද්ධ බලපෑම හරහා උද්ධමනය සහ උද්ධමන අපේක්ෂා කෙරෙහි වඩා ස්ථිර බලපෑමක් ඇති කළ හැකිය. මෙය ප්‍රතිපත්ති සම්පාදකයින් සැලකිල්ලට භාජනය කරන ප්‍රධාන කරුණක් වන අතර, එය උද්ධමනය පුරෝකථනය කිරීම වඩාත් අභියෝගාත්මක කරයි. මේ අතර, දේශගුණික විපර්යාස කෙරෙහි වැඩි අවධානයක් යොමු වී ඇති බැවින්, ප්‍රධාන ආර්ථික දර්ශක මත දේශගුණික විපර්යාසවලින් ඇතිවිය හැකි බලපෑම් වඩා හොඳින් ග්‍රහණය කර ගැනීම සඳහා මහ බැංකු දේශගුණික විචල්‍යය සහ/හෝ දේශගුණික විශේෂිත අවස්ථා ඔවුන්ගේ සාර්ව ආර්ථික ආකෘතිවලට ක්‍රමානුකූලව ඇතුළත් කරමින් පවතී.

1 කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) යනු ශ්‍රී ලංකාවේ උද්ධමනය මනින මිනුම් වේ. මෙම දර්ශක දෙකෙහිම, කාණ්ඩ 12 ක් අතරින් ආහාර කාණ්ඩයට විශාලතම බර තැබීමක් ඇති අතර, එය කො.පා.මි.ද.හි සියයට 26.2ක් සහ ජා.පා.මි.ද.හි සියයට 39.2ක් වශයෙන් වේ.

2 කො.පා.මි.ද. පැසෙහි සහල් කාණ්ඩයේ දායකත්වය සියයට 2.72ක් වන අතර පොල් කාණ්ඩය සඳහා එය සියයට 1.38කි.

**උද්ධමනය මත අනෙකුත් සැපයුම් අංශයේ සාධක සහ රජයේ ප්‍රතිපත්තිවල බලපෑම**

ප්‍රවාහනය සහ විදුලි උත්පාදනය යන අංශ දෙක සඳහාම ඛනිජ තෙල් ආනයනය කරන රටක් ලෙස, ගෝලීය ඛනිජ තෙල් මිල ගණන් ශ්‍රී ලංකාවට සැලකිය යුතු ලෙස බලපාන අතර එය උද්ධමනයේ හැසිරීම වෙනස් කිරීම සඳහා ඍජු හා වක්‍ර ආකාරයෙන් බලපායි. ශ්‍රී ලංකාව තුළ, බලශක්ති, ඛනිජ තෙල් සහ ගෑස් මිල ගණන් වර්තමානයේ නිතර සංශෝධනය කෙරෙන අතර එය පුළුල් ලෙස පිරිවැය ආවරණය වන පදනම මත තීරණය වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, භූ දේශපාලනික අර්බුද සහ ගෝලීය ආර්ථික තත්ත්ව හේතුවෙන් ගෝලීය වෙළඳ භාණ්ඩ මිලෙහි සහ නැව් ගාස්තුවල සිදුවන වෙනස්වීම් දේශීය මිල ගණන් කෙරෙහි බලපාන අතර, එය වර්තමානයේ දී පෙරට වඩා දේශීය මිල ගණන් කෙරෙහි විශාල බලපෑමක් ඇති කළ හැකිය.[3] මෑත කාලීන අත්දැකීම් අනුව, අවිනිශ්චිතතා මධ්‍යයේ උද්ධමනය කෙරෙහි විදුලි, ඉන්ධන සහ ගෑස් මිල ගණන් වෙනස්වීමේ වක්‍ර බලපෑම, ඍජු බලපෑමට වඩා වැඩි විය හැකිය. කෙසේ වෙතත්, දේශීය බලශක්ති මිල ගණන් සඳහා නිතිපතා සිදුකරන එවැනි ගැළපීම් මගින්, 2022 සහ 2023 වසරවල දී දේශීය ඉන්ධන සහ විදුලි මිල ගැළපීම් වැනි දේශීය මිල ගණන් සඳහා එක් වරක් පමණක් සිදු කළ දැඩි නිවැරදි කිරීම්වල අවදානම ඉවත් කරනු ඇත. මෙය ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී උද්ධමනයේ විශාල වෙනස්කම් අවම කර ගැනීමට සහාය වනු ඇති අතර, එමගින් උද්ධමන අපේක්ෂා පාලනය කිරීමට දායක වෙමින් ආර්ථිකයේ පාර්ශ්වකරුවන් විසින් ඉදිරි දැක්මක් සහිතව ආර්ථික තීරණ ගැනීම ප්‍රවර්ධනය කරනු ඇත.

තවද, බදු ව්‍යුහයේ නිතර සිදුවන වෙනස්වීම්, එක් වරක් සිදුවන සිදුවීම් වුවද, උද්ධමනයේ උච්චාවචනයන්ට සැලකිය යුතු ලෙස බලපෑ හැකිය. එකතු කළ අගය මත බද්දෙහි (VAT) සිදුකල මෑත කාලීන සංශෝධන ඉන්ධන මිල ඇතුළු පාරිභෝගික භාණ්ඩ පැසෙහි බොහෝ භාණ්ඩවල මිල කෙරෙහි සැලකිය යුතු ඍජු බලපෑමක් ඇති කළ අතර එමගින් උද්ධමනය කෙරෙහි වැඩි බලපෑමක් ඇති කළේය. එපමණක් නොව, ව්‍යාපාර මෙම බදු සංශෝධන තම අභිමතය පරිදි මිල වෙනස් කිරීමට භාවිතා කළ හැකි බැවින්, මෙම ප්‍රතිපත්තිවල ඍජු හා වක්‍ර බලපෑම් අවිනිශ්චිත විය හැකිය. තවද, අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා තරඟකාරිත්වය අවම වීම මෙන්ම මිල පහළ යෑමට ඇති අවහිරතා ද අඛණ්ඩ මිල පීඩනයන්ට හේතු විය හැකිය. සහල් සහ බිත්තර වැනි අත්‍යාවශ්‍ය භාණ්ඩ මිල ගණන් වෙළඳපොළේ සුළු පිරිසක් මෙහෙයවන බැවින් (කතිපයාධිකාරය), මෙම භාණ්ඩවල මිල සඳහා ඍජු පීඩනයක් මෙන්ම ඒ හරහා වෙනත් මිල ගණන් කෙරෙහි සැලකිය යුතු වක්‍ර බලපෑමක් ද ඇති කළ හැකිය.

**සමස්ත උද්ධමනය සඳහා සැපයුම් අංශයේ සාධකවල දායකත්වය**

උද්ධමනයේ හැසිරීම සඳහා හේතුවන ඉල්ලුම් සහ සැපයුම් සාධක වෙන වෙනම දැක්වීම ඒවා හඳුනාගැනීමේ සංකීර්ණත්වය හේතුවෙන් අභියෝගාත්මක ක්‍රියාවලියක් වේ. ආහාර උද්ධමනය සාමාන්‍යයෙන් සැපයුම් අංශයේ සාධක මත විශාල වශයෙන් රඳා පවතින බවට සැලකේ. කොළඹ පාරිභෝගික මිල දර්ශක (කො.පා.මි.ද.) පැසෙහි ආහාර කාණ්ඩයට අමතරව, ආහාර නොවන කාණ්ඩයේ ඇතැම් භාණ්ඩවල මිල ගණන් සංශෝධනයවන වාර ගණන සහ මිල ගණන් වෙනස්වීමේ ප්‍රමාණය අනුව මෙම භාණ්ඩවල මිල ද උද්ධමනය සඳහා සැපයුම්/පිරිවැය මත පදනම් වූ දායකයින් ලෙස වර්ග කළ හැකිය.[4]


සැපයුම් අංශයේ උද්ධමනය, සැපයුම් නොවන අංශයේ උද්ධමනය හා සසඳන විට බොහෝ විට වැඩි වශයෙන්

3 මෙම බලපෑම මීට පෙර අදාළ රජය සතු වාණිජ ව්‍යාපාර විසින් අවශෝෂණය කරන ලද අතර, එමගින් රාජ්‍ය මූල්‍ය අංශයට හෝ මූල්‍ය අංශයට බලපෑම් ඇති කරමින් මහජනතාව වෙත වක්‍රාකාරයෙන් බලපෑම් ඇතිකරනු ලැබීය.

4 මෙම ඇස්තමේන්තුව තුළ, සැපයුම/පිරිවැය මත පදනම් වූ කාණ්ඩය කො.පා.මි.ද. භාණ්ඩ හා සේවා පැසෙහි ආහාර සහ මධ්‍යසාර නොවන පාන වර්ග සහ පුද්ගලික ප්‍රවාහන උපකරණ සඳහා ඉන්ධන; විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන; ජල බිල්පත්; සහ ප්‍රවාහන සේවා වැනි තෝරාගත් පරිපාලිත මිල කාණ්ඩ නියෝජනය කරන අතර, සැපයුම් නොවන කාණ්ඩය කො.පා.මි.ද. පැසෙහි අනෙකුත් සියලුම උප කාණ්ඩ නියෝජනය කරයි.

**රූප සටහන වි.ස. 1.1**

**මතුපිට උද්ධමනය සඳහා දායකත්වය: සැපයුම් සහ සැපයුම් නොවන අයිතම (කො.පා.මි.ද. මත පදනම්ව, වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)**





(අ) ප්‍රධාන වශයෙන් කො.පා.මි.ද.යේ සැපයුම් සාධක මගින් මිල තීරණයවන අයිතම කාණ්ඩය සැපයුම් අයිතම ලෙස සැලකෙන අතර ඉතිරි අයිතම සැපයුම් නොවන අයිතම ලෙස සැලකේ (කාර්යමණ්ඩල විනිශ්චය මත පදනම්ව).

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මහ බැංකු කාර්යමණ්ඩල විනිශ්චය

රූප සටහන වි.ස. 1.2

**සැපයුම් අංශයේ උද්ධමනය (කො.පා.මි.ද. මත පදනම්ව, වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)**




(අ) ප්‍රධාන වශයෙන් කො.පා.මි.ද.යේ සැපයුම් සාධක මගින් මිල තීරණයවන අයිතම කාණ්ඩයේ සමස්ත මිලෙහි හැසිරීම මත පදනම්ව.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මහ බැංකු කාර්යමණ්ඩල විනිශ්චය

විචලනය වීමේ ලක්ෂණ නිරූපණය කරයි (සංඛ්‍යා සටහන වි.ස. 1.1). සැපයුම් අංශයේ උද්ධමනය සාමාන්‍යයෙන් ඉතා ඉක්මනින් වෙනස්වන ස්වභාවය අනුව, මහ බැංකු එයට මුහුණදීම සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග භාවිතා කිරීමේ දී පරීක්ෂාකාරී ප්‍රවේශයක් අනුගමනය කළ හැකිය. තව ද, සැපයුම් බාධාවන් ආර්ථික ක්‍රියාකාරකම් සහ මිල මට්ටම් ප්‍රතිවිරුද්ධ දිශාවලට යොමු කරන අතර, මහ බැංකුවකට ආර්ථික සහ මිල ස්ථායීතාවය යන දෙකම පවත්වා ගැනීමට අපොහොසත් විය හැකිය (Amarasekara, 2009). එවැනි තත්ත්ව තුළ, මිල ස්ථායීතාවය පමණක් ඉලක්ක කරගත් ප්‍රතිපත්ති හරහා සැපයුම් අවහිරතාවල බලපෑම්වලට ගන්නා ප්‍රතිචාර නිසා මූර්ත ආර්ථිකය මත දැඩි බලපෑම් ඇති කරයි. ඇතැම් සැපයුම් අංශයේ කම්පන, ක්ෂණික සහ දැඩි ප්‍රතිපත්ති ප්‍රතිචාරවල අවශ්‍යතාවක් නොමැතිව කාලයත් සමඟ නිවැරදි වීමට ඉඩ හැරීම වඩා යෝග්‍ය විය හැකිය. නිදසුනක් වශයෙන්, කාලගුණය ආශ්‍රිත සාධක වලින් තාවකාලික බලපෑම් පැන නගින්නේ නම්, එය කාලයත් සමඟ ක්‍රමයෙන් අඩු වනු ඇත. එහෙත්, එය භාණ්ඩ හා සේවා මත බදු සංශෝධන හෝ පරිපාලන වෙනස්කම්වල ප්‍රතිඵලයක් නම්, එහි ඍජු බලපෑම ප්‍රධාන වශයෙන් එක් වරක් පමණක් ඇති වේ. තාවකාලික හෝ එක් වරක් පමණක් ඇතිවන සැපයුම් කම්පනවලදී පවා, උද්ධමනයේ අනාගත ගමන් මග පිළිබඳ යම් සහතිකයක් සහ මගපෙන්වීමක් සැපයීමෙන් සහ උද්ධමන අපේක්ෂාවන් මනා ලෙස පාලනය කිරීමෙන් මහ බැංකු සන්නිවේදනය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

සංඛ්‍යා සටහන වි.ස. 1.1

**සැපයුම් අංශයේ සහ සැපයුම් නොවන අංශයේ උද්ධමනයේ සම්මත අපගමනය (කො.පා.මි.ද. මත පදනම්ව, වාර්ෂික ලක්ෂ්‍යමය, %)**

| වසර | මතුපිට උද්ධමනය | සැපයුම් | සැපයුම් නොවන |
|---|---|---|---|
| 2015 | 1.3 | 2.8 | 1.3 |
| 2016 | 1.1 | 2.5 | 0.8 |
| 2017 | 0.9 | 2.2 | 1.0 |
| 2018 | 1.0 | 2.1 | 0.2 |
| 2019 | 0.6 | 1.7 | 0.5 |
| 2020 | 0.8 | 1.3 | 0.5 |
| 2021 | 2.6 | 3.9 | 1.6 |
| 2022 | 20.3 | 32.0 | 11.0 |
| 2023 | 20.1 | 29.9 | 12.9 |

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

**උද්ධමනයේ සැපයුම් අංශයේ ගැටළු හැසිරවීමේ දී මහ බැංකුවල කාර්යභාරය සීමා වන්නේ ඇයි?**

මහ බැංකු සිය පාලනය මූලික වශයෙන් ඉල්ලුම් අංශයෙන් ඇතිවන උද්ධමන පීඩන කෙරෙහි පවතින බැවින් සැපයුම් අංශයේ කම්පනවලට සාමාන්‍යයෙන් ප්‍රතිචාර නොදක්වයි. සැපයුම් අංශයේ ගැටළු, මිල හා උද්ධමනය කෙරෙහි ක්ෂණික බලපෑමක් ඇති කළ හැකිය. මීට අමතරව, බොහෝ සැපයුම් අංශයේ සාධක ප්‍රධාන වශයෙන්ම ව්‍යුහාත්මක සහ කාලගුණය හා සම්බන්ධ වන අතර හුදෙක් ආර්ථික ක්‍රියාවලීන්ගේ ප්‍රතිඵලයක් නොවේ. එබැවින් මේ සඳහා විසඳුම් ලෙස ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම අරමුණු කරගත් රජයේ සැපයුම් අංශයේ ප්‍රතිපත්ති වැනි දිගුකාලීන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හෝ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අවශ්‍ය විය හැකිය. මහ බැංකුවල අරමුණ ඉල්ලුම මත පදනම් වූ ප්‍රතිපත්ති හරහා ආර්ථික ක්‍රියාවලීන්ගේ උච්චාවචන සඳහා පිළියම් යෙදීම නිසා මහ බැංකුවලට මේ සඳහා පාදක වූ ව්‍යුහාත්මක ගැටළු විසඳීමට නොහැකි වනු ඇත. එබැවින්, මුදල් ප්‍රතිපත්තිය හරහා සැපයුම් අංශයේ මිල පීඩන සඳහා පිළියම් යෙදීමට උත්සාහ කිරීම අහිතකර ප්‍රතිඵලවලට හේතු විය හැකිය. උද්ධමනය අඩු කිරීම සඳහා පොලී අනුපාතික ඉහළ දැමීම හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී විය හැකි අතර එමගින් සැපයුම් අංශයේ පීඩන තවදුරටත් වැඩි වනු ඇත.

කෙසේ වෙතත්, අඛණ්ඩ හෝ දැඩි සැපයුම් අංශ අවහිරතා සමස්ත මිල සහ ආර්ථික ස්ථායීතාව සඳහා පුළුල් වශයෙන් බලපෑම් ඇති කළ හැකි බැවින්, මහ බැංකු විසින් සැපයුම් අංශයේ උද්ධමනය සමීපව නිරීක්ෂණය

1

කරනු ලැබේ. ඇතැම් අවස්ථාවලදී, සැපයුම් අංශයේ ඇතිවන වෙනස්වීම් උද්ධමන අපේක්ෂා මත වක්‍ර බලපෑම් ඇති කරන විට හෝ දීර්ඝ කාලයක් පවත්නා උද්ධමනකාරී වාතාවරණයකට තුඩු දෙන විට, මහ බැංකුවලට මෙම බලපෑම් අවම කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග සලකා බැලිය හැකිය. මේ සම්බන්ධයෙන් සැලකීමේදී, එක් සැපයුම් කම්පනයකට වඩාත් සුදුසු මුදල් ප්‍රතිපත්ති ප්‍රතිචාරය කම්පනයේ ස්වභාවය සහ කාල පරාසය, එහි වක්‍ර බලපෑම් සහ මූර්ත ආදායමට ඇති බලපෑම මත රඳා පවතී (Bandera et al., 2023). මෙම සාධක සියල්ල සලකා බැලීම තුළින්, මුදල් ප්‍රතිපත්තිය ප්‍රතිචාරයක් නොදැක්විය යුතුද (looked through), එසේත් නැතිනම් ප්‍රතිපත්ති සංශෝධනයක් සිදු කළ යුතුද (lean against the shock) යන්න තීරණය කරයි. උද්ධමනකාරී සැපයුම් කම්පන මාලාවක් සඳහා දැඩි ප්‍රතිපත්ති ප්‍රතිචාරයක් අවශ්‍ය වේ. එවැනි අවස්ථාවන්හි දී, එක් එක් කම්පනයට තනි තනිව ප්‍රතිචාර දැක්වීම, මැදි කාලීන උද්ධමනය වෙනුවට නුදුරු කාලීන උද්ධමනය ඉලක්කයෙන් බැහැරවීම කෙරෙහි අවධානය යොමු කිරීම නිසා අනපේක්ෂිත ප්‍රතිඵල අත්විය හැකිය. එබැවින්, සැපයුම් කම්පන මාලාවක් සඳහා දක්වන මුදල් ප්‍රතිපත්ති ප්‍රතිචාර එවැනි කම්පනවල සමස්ත සාර්ව ආර්ථික බලපෑම මත පදනම් විය යුතු අතර, උද්ධමන අපේක්ෂාවන්හි හැසිරීම පිළිබඳ මනා තක්සේරුවක් ද ඇතුළත් විය යුතුය. තව ද, විශාල සහ අඛණ්ඩ සැපයුම් කම්පන මධ්‍යයේ, සුදුසු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මුලදීම ක්‍රියාත්මක කිරීම මගින් උද්ධමන අපේක්ෂා මනා ලෙස පාලනය කර ගත හැකි අතර, එමගින් මහ බැංකුවේ විශ්වසනීයත්වය ද ආරක්ෂා කර ගත හැකිය (John et al., 2022).

**සැපයුම් අංශයේ උද්ධමනය කළමනාකරණය කිරීමේ රජයේ කාර්යභාරය**

සැපයුම් අංශයේ උද්ධමනය කළමනාකරණය කිරීමේ දී විවිධ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ මැදිහත්වීම් හරහා රජය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ප්‍රවාහන සහ බලශක්ති වැනි යටිතල පහසුකම්වල ආයෝජනවලට ප්‍රමුඛත්වය ලබාදීමෙන් රජයට ආර්ථිකයේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවිය හැකිය. මීට අමතරව, පසු අස්වනු හානි වළක්වා ගැනීම සහ ආහාර මිල ස්ථායී කරන අතර දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගබඩා පහසුකම් වැනි කෘෂිකාර්මික යටිතල පහසුකම් සඳහා ආයෝජන ඉහළ නැංවීම කෙරෙහි රජයට, පෞද්ගලික අංශය සමඟ එක්ව, අවධානය යොමු කළ හැකිය. අනෙක් අතට, ආයෝජන සඳහා හිතකර පරිසරයක් ඇති කරමින් වෙළඳපොළ තරඟකාරිත්වය ශක්තිමත් කිරීම, ව්‍යාපාර සඳහා ඇති බාධක ඉවත් කිරීම, සහ රාජ්‍ය ආයතනවල ක්‍රියාවලීන් විධිමත් කිරීම සඳහා නියාමන ක්‍රියාමාර්ග ද ක්‍රියාත්මක කළ හැකිය. සැපයුම් අංශයේ කම්පන හේතුවෙන් ඇති වන හදිසි මිල පීඩනයන්ට කෙටි කාලීනව පිළියම් යෙදීම සඳහා, සැපයුම් අවහිරතා සහ හිඟයන් හේතුවෙන් වෙළඳපොළේ හිඟවන ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීමට අවශ්‍ය පරිදි පහසුකම් සැලසීම සඳහා රජයට පූර්වෝපායිකව පියවර ගත හැකි අතර එමගින් මිල ගණන් ඉහළ යෑම අවම කර ගත හැකිය. ඇමරිකා එක්සත් ජනපදයේ 2022 වසරේ උද්ධමනය අඩු කිරීමේ පනත සැපයුම් අංශයේ ගැටළු විසඳීම සඳහා රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග සම්බන්ධව මෑත කාලීන උදාහරණයකි. ඖෂධ මිල පහත හෙළීම සහ පරිසර හිතකාමී බලශක්ති ප්‍රභව ප්‍රවර්ධනය කරමින් දේශීය බලශක්ති නිෂ්පාදනය සඳහා ආයෝජනය කිරීම මගින් උද්ධමනය පාලනය කිරීම මෙම පනතේ අරමුණ වේ.

**නිගමනය**

කාලගුණික රටා, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් සහ රජයේ ප්‍රතිපත්ති වැනි සැපයුම් අංශයේ සාධකවල හැසිරීම, සහ උද්ධමනය කෙරෙහි ඒවායේ සැලකිය යුතු බලපෑම අතර සංකීර්ණ අන්තර් ක්‍රියාකාරිත්වයක් ඇත. විශේෂයෙන් ම දේශීය හා ගෝලීය පරිසරයෙන් ඇති වන සාධක රාශියක් මිල මට්ටම්හි උච්චාවචනයන්ට දායකවන ශ්‍රී ලංකාව වැනි කුඩා විවෘත ආර්ථික තුළ, සැපයුම මත පදනම් වූ උද්ධමනය වටා ඇති සංකීර්ණතා මුදල් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සැලකිය යුතු අභියෝග මතු කරයි. තාවකාලික සැපයුම් කම්පනවලට ක්ෂණික මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අවශ්‍ය නොවුවද, සැපයුම් අංශයෙන් අඛණ්ඩව එල්ලවන බාධා මිල ස්ථායීතාව පවත්වා ගැනීමේ කාර්යය සංකීර්ණ කළ හැකිය. තව ද, ඇතැම් සැපයුම් අංශයේ ගැටළුවල ව්‍යුහාත්මක ස්වභාවය සාම්ප්‍රදායික මුදල් ප්‍රතිපත්ති උපකරණවල විෂය පථයෙන් බොහෝ විට ඔබ්බට ගිය දිගු කාලීන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාව පෙන්වා දෙනු ලැබේ. සැපයුම මත පදනම් වූ උද්ධමනය ඍජුව පාලනය කිරීමේ සීමා පැවතිය ද, ආර්ථික ස්ථායීතාව සහ උද්ධමන අපේක්ෂාවන් කෙරෙහි අහිතකර බලපෑම් අවම කිරීම අරමුණු කර ගනිමින් මහ බැංකු ඒ පිළිබඳව අවධානයෙන් සිටී. අවසාන වශයෙන්, සැපයුම මත පදනම් වූ උද්ධමනයේ සංකීර්ණතා හැසිරවීමට කෙටි කාලීන ස්ථායීතාව මෙන්ම දිගු කාලීන ආර්ථික තිරසාර බව යන අංශ දෙකම සලකා බලන සමතුලිත උපාය මාර්ගයක් අවශ්‍ය වේ. උද්ධමනය මත ඇති ඉල්ලුම් පීඩන කළමනාකරණය කිරීම සඳහා සුදුසු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගන්නා අතරම මහ බැංකුවක් විසින් උද්ධමනය මත සැපයුම් අංශයේ බාධාවන්ගේ බලපෑම පිළිබඳව පැහැදිලිව සහ පූර්වෝපායිකව සන්නිවේදනය කිරීම මගින් උද්ධමන අපේක්ෂා කළමණාකරණය කිරීම සහ දේශීය මිල ස්ථායීතාව සහතික කිරීම අපේක්ෂා කරයි.

---


මූලාශ්‍ර

1. Amarasekara, C. (2009) Central bank objectives and aggregate disturbances. *Proceedings of the Central Bank of Sri Lanka International Research Conference - 2009*, pp. 41-55.
2. Bandera, N., Barnes, L., Chavaz, M., Tenreyro, S., and von dem Berge, L. (2023) Monetary policy in the face of supply shocks: The role of inflation expectations. *In ECB Forum on Central Banking,* pp. 26-28.
3. John, J., Kumar, D., and Patra, M.D., (2022) Monetary policy: Confronting supply-driven inflation, *RBI Bulletin, 76(7),* July 2022, pp. 97-109.
4. Peng, S., Huang. J., Sheehy. J., Laza. R., Visperas. R., Zhong. X., Centeno. G., Khush.G. and Cassman. K. (2004) Rice yields decline with higher night temperature from global warming, *Proceedings of the National Academy of Sciences,* 101(27), pp. 9971-9975.